නිපුණතාවය :- 2. ව්‍යාපාර පරිසරයේ බලපෑම වලට අනුගත වෙමින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට කටයුතු කරයි .

නිපුණතා මට්ටම :- 2.2. තාක්ෂණික සහ ආර්ථික පරිසරයේ බලපෑම් ඇසුරින් ව්‍යාපාර කටයුතු කාර්යක්ෂමව කිරීමට කටයුතු කරයි .

( දේශපාලන පරිසරයේ බලපෑම , නෛතික පරිසරයේ බලපෑම , තාක්ෂණික පරිසරයේ බලපෑම , ආර්ථික පරිසරයේ බලපෑම )

ඔබගේ පෙළ පොතේ පිටු අංක 16 සිට 18 දක්වා හොඳින් කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න .

**කෙටි සහ නිශ්චිත පිළිතුරු සපයන්න .**

01.රටක රජය විසින් ව්‍යාපාර කටයුතු මෙහෙයවීමේදී අනුගමනය කරන ප්‍රතිපත්ති දෙකක් නම් කරන්න .

02. රජය ව්‍යාපාර කටයුතු සඳහා නීති රීති පැනවීමෙන් ඉටුකර ගැනීමට උත්සාහ දරන කරුණු දෙකක් ලියන්න .

03. තාක්ෂණික දියුණුව නිසා වර්තමාන ව්‍යාපාර පරිසරයේ වෙනස්කම් සිදු වී ඇති ක්ෂේත්‍ර හතරක් නම් කරන්න .

04. ආර්ථික පරිසරය යනු කුමක්ද ?

05. ආර්ථික පරිසරයට අයත් සාධක දෙකක් නම් කරන්න.

**පහත සඳහන් ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න .**

01. ව්‍යාපාර සඳහා බලපාන නීති රීති ක්‍රියාත්මක කිරීමට රජය විසින් පිහිටුවා ඇති ආයතනයකි මධ්‍යම පරිසර අධිකාරිය (___)

02. අතීතයේ දී භාවිතා කළ සාමාන්‍ය තැපැල වෙනුවට වර්තමානයේ දී ව්‍යාපාර විද්‍යුත් තැපැල භාවිතා කරයි . (____ )

03. තාක්ෂණික පරිසරයේ සිදුවන ශීඝ්‍ර වෙනස්වීම් මගින් ව්‍යාපාර නිපදවන ඇතැම් භාණ්ඩ ඉතා ඉක්මණින් යල් පනියි . ( __)

04. රටක ඉතුරුම් වර්ධනය වන විට ආයෝජන කටයුතු සඳහා යෙදවිය හැකි මුදල් ප්‍රමාණය අඩු වේ. ( _____ )

05. රටක රැකියා අපේක්ෂා කරන සියලු දෙනාට ගැළපෙන රැකියාවක් ලැබේ නම් එය පූර්ණ රැකියා වියුක්තිය නම් වේ . ( ______ )